**ජාතික පර්යේෂණ සභාව - 2020**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

ජාතික පර්යේෂණ සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 20 ප්‍රකාරව සභාව විසින් පර්යේෂණ හා සංවර්ධන වියදම් සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තියත් හඳුන්වාදී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල දරා තිබුණු රු.72,822,765 ක පර්යේෂණ හා සංවර්ධන වියදම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. එසේම එක් එක් පර්යේෂණ සඳහා දරන ලද වියදම් සාරාංශයක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් ලෙස ලැබෙන මෙම ලැබීම් එම වර්ෂයේ ආදායම ලෙස හඳුනාගෙන තිබුණද එය වියදම ලෙස හඳුනාගනු ලබන්නේ අදාල පර්යේෂකයා විසින් මුදල් වියදම් කරන වර්ෂයට අදාලවයි. | මූල්‍ය ප්‍රකාශ සමඟ අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) දේපළ, පිරියත හා උපකරණ | 283,515,926 | ස්ථාවර වත්කම් ලේඛනයක් සහ වත්කම් උපලේඛනයක් | ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශ අනුව දේපළ, පිරියත හා උපකරණ ශුද්ධ අගයට වටිනාකම රු.283,515,926 ක් වන අතර එය ඉදිරිපත් කර ඇති වත්කම් ලේඛනයට අනුවද සමාන අගයක් ගනී. විගණනයේ වැරදි යැයි පෙන්වා දී ඇති අගය සටහන් කර ඇති ලේඛනයේ ඇති එම සාරාංශගත කොටස ආයතනයේ පහසුව සඳහා සකස් කර ඇති අතර එය මෙම ලේඛනයේ අනිවාර්ය කොටසක් නොවන අතර එහි යම් කොටස් යාවත්කාලීන කර නොමැත. | ස්ථාවර වත්කම් ලේඛනය හා වත්කම් උපලේඛන නිසි පරිදි පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,295,913 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,073,226ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.222,687ක යම් වර්ධනයක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පර්යේෂණ තුලින් ළඟාකරගන්නා ප්‍රතිඵලයන් රටෙහි අවශ්‍යතා සඳහා යොදා ගැනීමට සම්බන්ධ විය යුතු ආයතන සමඟ සම්බන්ධීකරණ කාර්යය ප්‍රමාණවත් පරිදි ඉටුවී නොතිබුණු අතර ඒ අනුව පර්යේෂණ | පර්යේෂණ හා ජාතික සංවර්ධනය සම්බන්ධ කිරීමේ පියවරක් ලෙස අපි අපගේ පර්යේෂණ ව්‍යාපෘති තක්සේරු කරමින් සිටිමු. නමුත් පර්යේෂණ ප්‍රතිදානයක් | පර්යේෂණ මඟින් සොයා ගන්නා ප්‍රතිඵලයන් රටෙහි අවශ්‍යතා සඳහා යොදාගත හැකි පරිදි අවශ්‍ය රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය නිසි |

| | | |
|---|---|---|
| ප්‍රතිඵල ප්‍රායෝගිකව භාවිතයට ගැනීමට අවශ්‍ය ක්‍රමවේදය නිර්මාණය වී නොතිබුණි. | ප්‍රායෝගික යෙදුමක් බවට පත්වීමට සැලකිය යුතු කාලයක් ගතවේ. බොහෝ NRC ව්‍යාපෘ ති වල සම්බන්ධීකරණයක් ඇති නමුත් ප්‍රායෝගික විසඳුමක් බවට පත්වීමට කාලය ගතවේ. | පරිදි පැවතිය යුතුය. |
| (ආ) පර්යේෂණ වැඩසටහන් වලදී අයදුම්පත් කැඳවීම මඟින් ඉහළ මට්ටමේ විද්‍යාත්මක කුසලතා හා ජාතික වැදගත්කමකින් යුතු අයදුම්පත් පමණක් තෝරාගෙන තිබුණ ද , ඇගයීම් කමිටුවල පැවති අඩුපාඩු, ඇගයීමේදී පර්යේෂක හා තොරතුරු හුවමාරු කර ගැනීමෙන් මනා සම්බන්ධීකරණයක් නොතිබීම හා පර්යේෂණ ප්‍රගතිය ලබාගැනීම හා සමාලෝචනය සිදුනොවීම වැනි කරුණු හේතුවෙන් 2011 සිට 2016 දක්වා සිදුකර තිබූ වටිනාකම රු.47,328,845 ක් වූ පර්යේෂණ 271 කින් පර්යේෂණ 15ක් අසාර්ථක වී තිබූ අතර තවත් පර්යේෂණ 7ක් අතරමග නතර කර තිබුණි . | පර්යේෂණයේ සාර්ථකත්වයට හෝ අසාර්ථකත්වයට පර්යේෂකයාම වගකිව යුතු බව කරුණාවෙන් සලකන්න. එය අසාර්ථක වුවහොත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ජාතික පර්යේෂණ සභාවේ වගකීම වේ. | පර්යේෂණයක් සාර්ථකව කර ගත හැකි ලෙස පර්යේෂණ සංවිධාන හා කළමනාකරණ ව්‍යුහය සකස්විය යුතුය. |
| (ඇ) බැංකු ගිණුම් ප්‍රකාශනයන්ට අනුව (TO) ඉලක්කගත බහුවිෂයානුබද්ද ප්‍රදාන යටතේ වන ව්‍යාපෘති 10 යෙහි වියදම් සිදු වූ ආකාරය නිරීක්ෂණය කළ විට පළමු වසරේ වියදම් වන ප්‍රමාණය සාමාන්‍යයෙන් සියයට 10 ක් බව නිරීක්ෂණය වූ අතර දළ වශයෙන් ව්‍යාපෘතියේ රු.463,619,984 ක් වූ මුළු මුදලින් සියයට 90 ක් පමණ මුදලෙන් පළමු වර්ෂය තුළ දී වියදම් නොවී ඉතිරි වී ඇති බව නිරීක්ෂණය විය. | ඉලක්කගත බහුවිෂයික ප්‍රදාන වල අප විසින් ඔවුන්ට අදාල උපකරණ මිලදී ගැනීම සඳහා ඔවුන් තම ව්‍යාපෘති ආරම්භයේ ලබාදුන් අයවැය සැලැස්මේ හැටියට ක්‍රියාකිරීම සඳහා අපගේ ව්‍යාපෘති මාර්ගෝපදේශය පරිදි භාවිතා කළ හැක. එමෙන්ම මෙම ව්‍යාපෘති සඳහා භාවිතා කරන සමහර උපකරණ රුපියල් මිලියන 5 ඉක්මවූ උපකරණ වන අතර එහි ප්‍රසම්පාදන කාර්යය සඳහා යම් සැලකිය යුතු කාලයක් ගතවේ. විශේෂයෙන් 2014 - 2018 දක්වා ප්‍රසම්පාදන කාර්යය සඳහා වෙන් වූ නිලධාරියකු නොසිටි අතර එම කාර්යය සඳහා නිලධාරීන් වෙන්කරන | ව්‍යාපෘති සඳහා ලැබෙන ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජන ගත හැකි ලෙස ප්‍රතිපාදන යොදාගත යුතුය. |

| | | |
|---|---|---|
| | ලද්දේ අමතර කාර්යයක් ලෙස වේ. | |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉලක්ක මත පදනම් වූ බහු විෂයානුබද්ධ විශාල ව්‍යාපෘති (TOපර්යේෂණ) ලෙස රටෙහි ආර්ථික සංවර්ධනය ,සමාජ සුභසාධනය සහ පාරිසරික තිරසාරභාවය සඳහා ජාතික වශයෙන් අදාළත්වයක් සහිත ගැටළු විසඳීම අරමුණු කරගෙන 2014 වර්ෂයේ ආරම්භ කර වසර 05කින් නිම කළ යුතුව තිබූ වටිනාකම රු.193,086,099ක් වූ පර්යේෂණ 4 කින් රු.49,500,000 ක් වූ පර්යේෂණයක් විගණිත දිනය වූ 2021 අප්‍රේල් 08 දක්වාම නිමවී නොතිබුණු අතර පර්යේෂණ කටයුතු නිමකර තිබූ අනෙක් පර්යේෂණවල අවසාන වාර්තා භාරදීම හා පර්යේෂණ ඇගයීම සිදුකර නොතිබුණි. | TO 14-18 ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට සහාව පියවර ගන්නා ලදී. TO 14-10 ව්‍යාපෘතිය මේ වන විට අවසන් කර ඇති අතර ඔවුන්ගේ අවසන් වාර්තාව මේ වන විට අධීක්ෂණය කරමින් පවතී. | සැළසුම් කළ නියමිත කාලය තුල පර්යේෂණ නිමකර නිසි පරිදි පර්යේෂණ වාර්තා භාර දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) රට තුළ පවත්නා විවිධ අවශ්‍යතා හඳුනාගෙන පර්යේෂණ සිදුකර විසඳුම් සෙවීම මඟින් දැනුම වැඩිකර ගැනීම සඳහාත් රටෙහි සංවර්ධනය සඳහාත් අන්වේෂක (ID) මත පදනම් වූ පර්යේෂණ සිදුකර තිබූ අතර, 2010 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සිදුකර තිබූ පර්යේෂණ 384කින් නිමකර තිබූ පර්යේෂණ 227ක් විද්‍යාත්මක සඟරාවල ප්‍රකාශනය කිරීමෙන් හා සමුළුවලට සහභාගි වීමට අවස්ථාව ලබා ගැනීමෙන් අවසන් කර තිබූ අතර රටෙහි සංවර්ධනය සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි . | විමර්ශකයා විසින් මෙහෙයවනු ලබන ප්‍රදානවල අරමුණ වන්නේ නව දැනුම සොයා ගැනීමයි. සොයාගත් නව දැනුම විද්‍යාත්මක ප්‍රජාවට මෙන්ම සාමාන්‍ය ප්‍රජාවට ද ව්‍යාප්ත කළ යුතුය. මෙය විද්‍යාත්මක ප්‍රකාශන හා සම්මන්ත්‍රණ හරහා සිදුකෙරේ. | පර්යේෂණ මඟින් සිදුකරන සොයාගැනීම් පිළිබඳව විද්‍යාත්මක සඟරාවල පළ කිරීමෙන් නොනැවතී රටේ සංවර්ධනයට දායක කර ගත හැකි පරිදි අවශ්‍ය ක්‍රමවේදයක් නිර්මාණය විය යුතුය. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉලක්කගත බහුවිෂයානුබද්ද ප්‍රදාන (TO) සඳහා එක් පර්යේෂණයකට ආසන්න වශයෙන් රු.මිලියන 50ක මුදලක් ලබාදී තිබූ අතර එම සම්පූර්ණ මුදලම වසර 05ක පමණ කාලයක් සඳහා ජංගම ගිණුමේ තැන්පත් කර තිබුණි .මෙලෙස සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම ගිණුම්වල තැන්පත්කර තිබුණු මුදල රු.463,619,984 ක් විය. එසේම සභාව විසින් පර්යේෂණ තෝරා ගැනීමෙන් පසු එහි වියදම් දැරීම සඳහා 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ අන්වේෂණ පදනම මත වූ පර්යේෂණ 40කට ලැබී තිබූ රු.180,464,683 ක් වූ ප්‍රදාන ඒ ඒ පර්යේෂණය සඳහා ආරම්භ කරන ලද ජංගම ගිණුම්වල තැන්පත් කිරීමෙන් පසු පර්යේෂණ ආරම්භ කිරීම මාස 03ත් මාස 15 ත් අතර කාල පරාසයක් ප්‍රමාදකිරීම නිසා එකී මුදල් ජංගම ගිණුම්වල නිශ්ක්‍රියව පැවතුණි. | භාණ්ඩාගාරයෙන් අපට මුදල් ලබා දෙන්නේ ඔවුන් රටේ පර්යේෂණ සඳහා කරන ආයෝජනයක් ලෙස වන අතර පර්යේෂකයන් එම මුදල් පළමු වර්ෂ දෙක තුල පර්යේෂණ සඳහා අවශ්‍ය දෑ සඳහා වියදම් කරන අතර යම් කිසි ආයෝජනයක් සිදු කර එම මුදල් ලැබෙන තුරු බලාසිටිම මඟින් වන පාඩුව ඊට වඩා විශාල විය හැක. රාජ්‍ය මුදල් පර්යේෂණ වල ආයෝජනය කරනු ලබන්නේ අප අමාත්‍යාංශයේ අයවැය මඟින් වන අතර එය පාර්ලිමේන්තු අනුමැතියකින් අනතුරුව මුදල් අමාත්‍යාංශය විසින් ලබා දෙන්නකී. පර්යේෂණ ප්‍රදානයන් ලබා දුන් සැනින් වියදම් දැරීමේ හැකියාවක් කිසිදු ප්‍රදානයකට හැකියාවක් නොමැත. වියදම් දැරීමට ප්‍රථම තාක්ෂණික ඇගයීම් කමිටුව, ලංසු විවෘත කිරීමේ කමිටුව පත්කර ගැනීම සිදුකළ යුතුය. පසුව භාණ්ඩ හෝ සේවා ලබා ගැනීම සඳහා අදාල මූලික අනුමැතීන් ලබා ගත යුතුය. අනතුරුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි ආකාරව සිදු කළ යුතුය. මේ හේතු නිසා ද ප්‍රදානයන් වල වියදම් දැරීම ප්‍රමාද වේ. ජාතික පර්යේෂණ සභාවේ මාර්ගෝපදේශය අනුව ප්‍රදාන ලබා දී මාස 9 ඇතුලත ප්‍රදානයන්හි භාණ්ඩ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකළ යුතු අතර අදාල ලිපිගොනුව පර්යේෂණ සභාව වෙත එවා තිබිය යුතුය. | පර්යේෂණ සඳහා ලැබෙන මුදල් උපරිම කාර්යක්ෂමතාව යෙන් යෙදවිය යුතු අතර ප්‍රදාන මුදල් ලැබුණු පසු හැකි ඉක්මනින් පර්යේෂණ ඇරඹීම සිදු විය යුතුය. |